සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	**සිංහල භාෂාව හා සාහිත්‍යය I -II**	කාලය / நேரம் / Time — පැය තුනයි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

සැලකිය යුතු යි:
- අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.
- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා , තේරුම් ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබා දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

❖ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් **සමීප අර්ථය දෙන** උත්තරය තෝරන්න.

01. ඔවුන් **අත්වැල් බැඳ ගෙන** ජීවත් වන ආකාරය කාගේත් පුදුමයට හේතු විය.
(1) අත් අල්ලා ගෙන (2) ඉතා සතුටින් (3) එකට එක් වී (4) අතට අත දී

02. මාගේ සැර වැර කිරීම් හමුවේ අක්කා **කරබාගෙන** සිටියා ය.
(1) කර පහත් කර ගෙන (2) කෝපයෙන් (3) ලැජ්ජාවෙන් (4) නිශ්ශබ්ද ව

03. පියා **මර ඇඳේ සිටිය දී** දරුවෝ සමගියෙන් වස්තුව බෙදා ගත්හ.
(1) අන්තිම අවස්ථාවේ (2) මුල් අවස්ථාවේ
(3) මියගිය අවස්ථාවේ (4) මධ්‍යස්ථ අවස්ථාවේ

❖ අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. යම් සිදුවීමක් ..... කිරීමෙන් රසවත් කෙටි කතාවක් නිර්මාණය කර ගත හැකි ය.
(1) ප්‍රකාශනය (2) විකාශනය (3) පරිකල්පනය (4) ප්‍රසාරණය

05. සංඝාවාසයකට සාමාන්‍යයෙන් ..... වූයේ 'ආරාම' නැතහොත් 'විහාර' යන නම යි.
(1) විස්තර (2) ගෞරව (3) භාවිත (4) ව්‍යවහාර

Past Papers Wiki

06. දීපාවලිය සැමරීම පිළිබඳ පාදක වූ ..... කිහිපයක් ම හින්දු සමාජයේ ප්‍රචලිත ය.

(1) විශ්වාස (2) පුරාවෘත්ත (3) පුරාණෝක්ති (4) කටකතා

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) සෙබළා, මිශ්‍රන, නිශ්ප්‍රභා, පිළියෙල (2) කම්මැලි, දමනය, බොරළු, මැතිණිය

(3) මාලිගාව, වාලුකා, ශූරතාව, සාවද්‍ය (4) දෘෂ්ටි, සියළු, ප්‍රවේශ, දියණි

08. කේලම, නෑඹිලිය, රූපය, පෞරාණික යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඇදය, කොම්බුව හා ගයනුකිත්ත

(2) කොම්බුව හා ගයනුකිත්ත, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඇදය

(3) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ ඇදය, කොම්බුව හා ගයනුකිත්ත, දීර්ඝ පාපිල්ල

(4) කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ ඇදය, දීර්ඝ පාපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත

09. 'නිධිය' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,

(1) ඕෂ්ඨ්‍ය, මූර්ධජ හා දන්තජ ය. (2) දන්තජ, දන්තජ හා තාලුජ ය.

(3) කණ්ඨ්‍ය, දන්තජ හා මූර්ධජ ය. (4) දන්තජ, මූර්ධජ හා කණ්ඨ්‍ය ය.

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) විනිසුරු, ශාරිපුත්‍ර, දිනිතිය, බිලිදු (2) කුඹලා, උළිඳු, රේණු, මිණිමුතු

(3) විරාගත, තණ්හාව, පෘතුගීසි, ලලනාව (4) ගවේෂණ, ජෛන, සෘජු, ධනවත්

11. **අනුක්ත නාම පද පමණක්** යෙදී ඇති වරණය තෝරන්න.

(1) ගායිකාවක, මිතුරන්, මා, මුවකු (2) මිනිසෙක්, ගොවියන්, ගුරුවරු, මවක

(3) අප, කිරිල්ලියක, නළුවෝ, නිලධාරීන් (4) මොනරෙකු, දෙවියන්, කවීහු, ඇත්තු

12. මිශ්‍ර ක්‍රියා පදයක් හා ප්‍රයෝජ්‍ය ක්‍රියා පදයක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ගයා, නටවයි (2) කප කපා, දුවවයි

(3) බලද්දී, බලවා (4) කමින්, බීවොත්

13. උපසර්ග පදයක් හා නිපාත පදයක් යෙදුණු වරණය තෝරන්න.

(1) වෙළෙන්දා නගරයට ගියේ ය.

(2) මම පාඩම් කර සුමිහිරි ගීතයකට සවන් දුන්නෙමි.

(3) ඈ විවාද තරගයෙන් යළි ජය ගත්තා ය.

(4) නාවිකයෝ මහා සයුර තරණය කළහ.

14. දිවේ මුල කොටස උගුර දෙසට ළං වීමෙන් උපදින ශබ්ද හඳුන්වන අක්ෂර නාමය කුමක් ද?

(1) මූර්ධජ (2) දන්තජ (3) තාලුජ (4) කණ්ඨජ

❖ අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

15. මහලු පෙනුමක් ගත් පූජක බමුණාගේ **සොඬු** හැකිලී තිබුණි.

(1) කට (2) කම්මුල් (3) බෙල්ල (4) සම

16. ඔහුගේ **සඛවස** සියලු දෙනා පිළිගත්හ.

(1) සත්‍ය වචන (2) කරුණාව (3) සහයෝගය (4) ප්‍රිය වචන

17. ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන් **ස්ථිරවාසිතාවට** පත් වූ බව පෙන්වන දර්ශකය වන්නේ නිවාස තනා ගැනීම යි.

(1) තැනින් තැනට ගමන් කිරීමේ පුරුද්දට (2) දඩයම් කිරීමේ පුරුද්දට
(3) එක් තැනක දීර්ඝ කාලයක් ජීවත් වීමේ පුරුද්දට (4) බඩු භාණ්ඩ එක් රැස් කිරීමේ පුරුද්දට

18. ස්වර සන්ධියට හා ආගම සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) දෙවුර, හිතැති (2) වයසැති, නැවියාට
(3) කටුවල, ගසෙහි (4) දුටුවෙක්, උපනුපන්

19. දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(1) අඩුව, මිටිය, කියත, නියන (2) පාට පෙට්ටිය, පොත, පෑන, පැන්සල
(3) දැකැත්ත, උදැල්ල, නඟුල, කුරුණිය (4) හැන්ද, පිඟාන, ගෑරුප්පුව, පොරොව

20. තද්ධිත නාම පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) නිපුණතා, ප්‍රවීණත්ව (2) දැවුරුදු, දෙවිඳු
(3) නිලුපුල්, සිත්තම් (4) ගුණාංග, විචිත්‍රවත්

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මිදුල - අංගණය කන්ද - පව්ව ආශ්‍රය - නිරාශ්‍රය
(2) කුලුණු - කරුණාව රුවන් - මැණික් නෙලුම් - කුසුම්
(3) සුදු - ශ්වේත තුරු - තාරකා පෑළදිග - අපරදිග
(4) සයුර - රුවනාර මැදුර - නිවස අහස - මිහිලිය

22. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **වන** වරණය තෝරන්න.

(1) සශ්‍රීක - සරු
(2) සාමාන්‍ය - විශේෂ
(3) කනස්සල්ල - සන්තාපය
(4) රහිත - ශූන්‍ය

23. යුගල පදයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) පුද පූජා, තෑගි බෝග, ගේදොර, කසුකුසු
(2) රොඩුබොඩු, නඩුහබ, මිල මුදල්, ආහාරපාන
(3) ඉඟිබිඟි, ලට්ට ලොට්ට, එහාමෙහා, වංහුං
(4) අවිආයුධ, සිරිසැප, තුටුපහටු, ඔබමොබ

24. උපමාවක් සහිත වරණය තෝරන්න.

(1) සුනෙර මතින් අලළන සඳ කිරි සයුර
(2) පිපී මලක් වී ගේ ළඟ සුදු රෝස
(3) නුඹ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
(4) කෙකටිය මල් සුද තවරා - උඹේ සිනා කිරි උතුරා

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.

(1) සේනක බිබිලේ ගැළපෙන ඖෂධ ප්‍රතිපත්තියක් තත්ත්වයන් වටහා ගෙන ශ්‍රී ලංකාවට සැලසුම් කළේ ය.
(2) රටක පැවැත්වෙන උත්සව, චාරිත්‍ර, ඇදහිලි එම රටේ පිළිබිඹු කරන අනන්‍යතාව කැටපතක් බඳුය.
(3) අත්දැකීම් ඇසුරු කර ගෙන කවියට නැඟීම සිත තුළ උපන් හැඟීම් කාව්‍ය නිර්මාණකරණය යි.
(4) කන්නන්ගර මැතිතුමාගෙන් මෙරටට ඉටු වූ විශිෂ්ටතම සේවය නිදහස් අධ්‍යාපන ක්‍රමය බව අවිවාදාත්මක ය.

❖ අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. තමන්ගේ දේවල් තමාට ඉතා වටිනා බව

(1) කිරි මුහුදට හඳ පෑව්වා වගේ
(2) උණහපුළුවට උගෙ පැටියා මැණික ලු
(3) නැයින් බල බලා කැවුම් බෙදුවා ලු
(4) ආතාට අටු කොස් දුන්නා වගේ

27. එක් කරදරයක් පිට තවත් කරදරයක් ඒම.

(1) අලි මදිවට හරක්
(2) උඩින් මිතුරු යටින් හතුරු
(3) යකාට දොළ නොදී බැරි ලු
(4) කොටි වලිගය අල්ලා ගත්තා වගේ

28. වැරදි ලෙස ප්‍රකෘතිය දැක්වෙන වරණය තෝරන්න.

(1) ගිරවු - ගිරා
(2) අත්තෙන් - අතු
(3) ඇසුහ - ඇසු
(4) නටවයි - නට

❖ අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

29. (1) සංගීත කාමරයේ ශිෂ්‍යයන් ඇත.
(2) නුඹලා අනාගත නායකයන් ද?
(3) දක්ෂ නිවේදිකාවක් වන්නේ කෙසේ ද?
(4) ඕ තොමෝ දරුවන් ආරක්ෂා කළා ය.

30. (1) මිනිසුන් විසින් ගස් කපනු ලබති.
(2) මා විසින් නුඹ රැකෙහි.
(3) කම්කරුවා විසින් ස්වාමියාට කරුණු පැහැදිලි කරනු ලබති.
(4) සොරු විසින් ගෙවල් බිඳෙයි.

31. ඈ ඉතා ප්‍රඥාවන්ත ..... දහම් කරුණු අවබෝධ කරගත්තා ය.
විභාගයට පෙනී සිටීම ..... ඔහු අයදුම් පත්‍රය යොමු කළේ ය.
විදේශගත වූ දියණිය ..... නොයෙකි'යි දෙමව්පියෝ සිතූහ.
මුව දෙන පැටවුන් ..... වනයේ සැරිසරුවා ය.

(1) බැවින්, සඳහා, යළි, කැටුව
(2) යළි, කැටුව, බැවින්, සඳහා
(3) කැටුව, සඳහා, යළි, බැවින්
(4) සඳහා, බැවින්, යළි, කැටුව

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මං ගෙදර යනකොට අම්මා ඇවිල්ලා හිටියා"

(1) මා නිවසට යද්දී අම්මා ඇවිත් සිටියා ය.
(2) මම නිවසට යද්දී අම්මා පැමිණ සිටියා ය.
(3) මා නිවසට යද්දී අම්මා පැමිණ සිටියා ය.
(4) මම ගෙදර යද්දී අම්මා පැමිණ සිටියා ය.

33. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ලියූ කාව්‍ය ග්‍රන්ථයක් නොවන්නේ මින් කුමක් ද?

(1) පරෙවි සන්දේශය
(2) හංස සන්දේශය
(3) සැළලිහිණි සන්දේශය
(4) කාව්‍යශේඛරය

Past Papers Wiki

34. පහත සඳහන් කවියේ තුන්වන පදය තෝරන්න.

පෙර කල් ජාතියෙ පැතුවා වැන්නේ
පරමල් පිදුවාදෝ පල දුන්නේ
.....
හැම කල් මළ දා දෝ සැප වන්නේ

(1) වාල් තමාවත් ඇද්ද ඉතින්නේ
(2) මහල්ල නුඹගේ හිමි ද අසන්නේ
(3) වාල් විඳින දුක් මෙනුඹ විඳින්නේ
(4) නර මුල් ඇහ ඇට කිඹුලකු වැන්නේ

35. මොනරාගල ජනවහරට අනුව 'ගහමව්වා' යනු,

(1) රණ්ඩු වෙනවා
(2) නිදාගත්තා
(3) වීසි කළා
(4) දුවනවා

36. ගංගා තරංග රාව දී රිදී වණින්
මල් පිපී කුළින් කුළේ හැපී
ගායනා කරන්නේ
ආකාශයේ නැගී ..... යන ගීත ඛණ්ඩයේ රචකයා වන්නේ,

(1) අරිසෙන් අහුබුදු
(2) මහගම සේකර
(3) ඇස්. මහින්ද හිමි
(4) හෙන්රි ජයසේන

37. කාව්‍ය නිර්මාණකරණය මෙන් ම විවිධ ශාස්ත්‍ර හා විෂය සම්බන්ධ පරිණත අවබෝධය හැඳින්වෙන්නේ,

(1) ව්‍යුත්පත්තිය යනුවෙනි.
(2) ප්‍රතිභාව යනුවෙනි.
(3) සතතාභ්‍යාසය යනුවෙනි.
(4) පරිකල්පනය යනුවෙනි.

38. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් සූචනය වන නිවැරදි ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) ජා ව පූ ය ලි ර
(2) ර මා අ තු ව ර
(3) ත් ර ණ බු ස
(4) ත් ව ගු ල ති ය

39. සිංහලයෙහි 'කෙත' යනුවෙන් හැඳින්වෙන ගොවි බිම සඳහා යෙදෙන පදයක් නො වන්නේ මින් කුමක් ද?

(1) ලියද්ද
(2) උබර
(3) කොඹර
(4) කමත

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

"කතා පුවතේ සිදුවීමෙහි ඇතුළත් ඇතැම් අවස්ථා ඉවත් කිරීමටත් එහි නොමැති දේ අලුතින් එකතු කිරීමටත් එහි ඇතැම් සිදුවීම් වෙනස් කිරීමටත් නාට්‍ය පෙළ රචකයාට නිදහස තිබේ."

(1) කතා පුවත වෙනස් කිරීමට නාට්‍ය රචකයාට හැකියාව ඇත.
(2) නාට්‍යයට උචිත අවස්ථා තෝරා ගැනීමට නාට්‍ය පෙළ රචකයාට නිදහස හිමි වේ.
(3) කතා පුවතක් වෙනස් කිරීමේ හැකියාව නාට්‍ය පෙළ රචකයා සතු නොවෙයි.
(4) යම් කතා පුවතක් පවතින ආකාරයට ම නාට්‍යය සඳහා ගත යුතු නැත.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade } 10 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම / பெயர் / Name } .....

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } .....

උපදෙස් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන අසූවකි.

---

1) අංක (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට **කෙටි උත්තර** ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නො ලියන්නේ නම්**, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක **පමණක් නිදොස් කර** නැවත ලියන්න.

ශ්ලෝක සජ්ඣායනයේ දී නිවැරදි ලෙස ශබ්ද උච්ඡාරණය කළ යුතු බවත් එසේ නොකිරීම එහි අර්ථය හානි වීමට හේතු වන බවත් ගුරුවරයා පැවසුවේ ය.

ii. සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් පහත සඳහන් අක්ෂර උත්පත්ති ස්ථාන අනුව වර්ග කර දක්වන්න.

(අ). ඍa, ඍaa, ර, ළ, ෂ (ආ) ඉ, ඊ, ය, ශ

iii. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ නිවැරදි වාක්‍ය දෙකක් ලියන්න.

(අ) සරන (ආ) සරණ

iv. පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදහස් කර නැවත ලියන්න.

(අ) මිනිසුන් සියල්ලෝ සුවපත් වෙත් වා!

(ආ) සත්පුරුෂයෝ විසින් පිනට දහමට සිත් යෙදෙයි.

v. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) පශ්චාත් (2) මුග්ධ

vi. පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) පර්වත හේතුවෙන් ගමන දුෂ්කර වූ ප්‍රදේශය

(ආ) ව්‍යාජ ආකාරයෙන් කියන කියුම

vii. පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා ප්‍රවර්ගයකට අයත් ද?

(අ) පැසුණු හිසින් බුහුමන් **ලබව.**

(ආ) හිරු කිරණ **වැටෙත** පිනි වියැකේ.

viii. "හිමි තම නැණ නැවින්
සැදි සිප් තරහ බෙහෙවින්
වෙණ සිප් මහණ වින්
කළේ ඔහු පරතෙරට මැනවින් "
මෙම පද්‍යයේ ඇතුළත් **රූපක අලංකාර** දෙකක් ලියා දක්වන්න.

ix. පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

(අ) නාට්‍ය නිෂ්පාදකයෝ ප්‍රේක්ෂකයන් කුල්මත් කරති.

(ආ) ජනමාධ්‍ය මහජනතාවට සත්‍ය ප්‍රවෘත්ති නොසඟවා ඉදිරිපත් කරයි.

x. පහත සඳහන් ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර පොදු ව්‍යවහාරයෙන් ලියන්න.

(අ) කුදහව්වා (ආ) යාකොය් (ලකුණු 2×10=20 යි.)

2) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) කිසි දිනෙක කතා කර අවසන් කළ නොහැකි මාතෘකාවක් ලෙස රිය අනතුරු ප්‍රමුඛ කරුණක් වී ඇත. රියැදුරන්ට ම පමණක් විශේෂයෙන් ඇඟිලි දිගු කළ ද රිය අනතුරු අවම වීමට හෝ රිය අනතුරු නැති රටක් බවට පත් වීමට සම්පූර්ණ විය යුතු අංග රැසකි. ප්‍රමාණවත් මාර්ග ඉදි කිරීම, ධාවනයට සුදුසු රථවාහන පමණක් යොදවා ගැනීම, රියදුරන්ගේ, පදිකයන්ගේ සියලු දෙනාගේ ම විනයවත් බව, ආදී මූලික කරුණු මත මේ සියල්ල තීරණය වනු ඇත. එබැවින් මිනිස් ජීවිත රැක ගැනීමට නිසි, ඉක්මන් පියවර ගත යුතු වේ.

(ආ) පාසල් දරුවන් සඳහා දහතුන් වසරක අධ්‍යාපනය ලබා දීමටත්, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඔස්සේ අලුත් මානයන් වෙත විෂය දැනුම වැඩි දියුණු කිරීමත් සැබෑ ලෙස අධ්‍යාපනයේ අවශ්‍යතාව වී ඇත. ශ්‍රී ලංකාවේ ඉගෙනුම ලබන දරුවා ජාත්‍යන්තරය ජය ගන්නා අයකු බවට පත් වීමට ඇති එක ම ආධාරකය අධ්‍යාපනය යි. එබැවින් දරුවන් සඳහා වන පාසල් අධ්‍යාපනය තුළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම කාලෝචිත ජාතික කර්තව්‍යයකි.

(ඉ) වත්මන් ළමා හා තරුණ පරපුර කෙටි ආහාර සඳහා ඇබ්බැහි වීම බේදවාචකයක් වී ඇත. දශක හතරකට පමණ පෙර ශ්‍රී ලංකාවේ කුඩා දරුවෝ, වැඩිහිටියෝ කොස්, දෙල්, අල, බතල ආදී වඩා පෝෂ්‍යජනක ආහාර ප්‍රමාණවත් ව ආහාරයට ගත් බැවින් ඉහළ මට්ටමේ ප්‍රතිශක්තියකට උරුමකම් පෑහ. එහෙත් අද වන විට කුඩා දරුවන් මෙන් ම වැඩිහිටියන් ද ක්ෂණික, කෙටි, රසවත්, වර්ණවත් ආහාර ප්‍රයෝජනයට ගැනීම විලාසිතාවක් පමණක් නොව පුරුද්දක් බවට පත් කරගෙන ඇත. රටක් ලෙසත්, රටේ අනාගත තරුණ පරපුර ලෙසත් ඉතා අවිනිශ්චිත, අපැහැදිලි තත්ත්වයක් පෙන්නුම් කරනු ඇත.

(ඊ) මීට කලකට පෙර වැඩි කතාබහට ලක් වූ සමාජ රෝග කිහිපයක් පිළිබඳ නැවතත් උණුසුම් කතාබහක් හට ගෙන ඇත. 2022 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ එච්.අයි.වී (HIV) රෝග වාහකයින් සංඛ්‍යාව ඉහළ යාම ඉතා භයානක ය. සාර්ථක ජීවිතයක් සඳහා අධ්‍යාපනය ලබා, රැකියාවකට එළඹෙන වයසේ තරුණයකු තරුණියක රෝග වාහකයකු වීම කෙතරම් ශෝචනීය දැයි හැඟේ. තත්ත්වය මෙසේ වීම අනාගත රටේ තාරුණ්‍යය පිළිබඳවත්, සංවර්ධනය පිළිබඳවත් ඇති කරන්නේ අනියත බියකි. (ලකුණු 25 යි.)

3) පහත සඳහන් ඡේදය වචන 50 – 60 අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

සාහිත්‍ය යුග බෙදා ගන්නා විට සාහිත්‍ය හැදෑරීමට කිසියම් පහසුවක් ඇති වන්නේ ග්‍රන්ථයක් පිළිබඳ ව අධ්‍යයනය කිරීමට තත් යුගය පිළිබඳ යම් අවබෝධයක් තිබිය යුතු නිසා ය. මෙසේ යුග බෙදීමේ දී යම් බඳු අසාධාරණයක් ද ඇති වේ. කිසියම් රාජධානියක නැගීම සහ බැසීම යන තත්ත්වයන් ඒකාකාර ව සිදු නො වේ. නමුත් මෙහි දී පිළිගත හැකි සත්‍යයක් නම් රාජ්‍ය නැඟීමත් සමඟ ම සාහිත්‍යය ද නැඟීමයි. එහෙත් ඒ නිසා ම සාහිත්‍යයේ උන්නතියක් ඇති වන බව කිව නො හැකි ය. එසේ ම රාජ්‍යයක පරිහානියත් සමග ම සාහිත්‍යයක් පිරිහෙන්නේ ද නැත. මේ නිසා මෙසේ යුග බෙදීම එක් අතකින් අවාසියක් ලෙස පෙනී යයි.

එක සාහිත්‍ය යුගයක් ස්වර්ණමය යුගයක් ලෙස ගැනීම පහසු කාර්යයක් නො වේ. රජවරුන් කිහිප දෙනෙකු රාජ්‍ය කළ කාලවලින් එක් අයෙකු හෝ දෙදෙනෙකු සිටි කාලය පමණක් සාහිත්‍යය දියුණු විය හැකි ය. එ නිසා සම්පූර්ණ රාජ්‍ය යුගය ම අළලා සාහිත්‍ය දියුණුව දැක්වීම එතරම් සාධාරණ නො වේ. තවත් විටෙක රාජ්‍යයේ බලපෑමක් නැති ව සාහිත්‍ය දියුණු වූ යුග තිබේ. සෙංකඩගල රාජ්‍ය පැවති යුගයේ දකුණේ සාහිත්‍යය දියුණු විය. තවත් සමහර රාජ්‍ය යුගවල එකදු සාහිත්‍ය කෘතියක්වත් ලියැවී නැත. නිදසුනක් ලෙස යාපහු යුගය දැක්විය හැකි ය. නමුත් මෙලෙස සාහිත්‍ය යුග බෙදීමේ දී ඒ ඒ යුගවල සාහිත්‍යයට බලපෑම් ප්‍රවණතා දැන ගැනීමට හැකි වේ. එබැවින් යුග බෙදීමේ දී වාසි අවාසි දෙක ම පෙන්වා දිය හැකි ය.
(ලකුණු 10 යි.)

4) පහත සඳහන් උද්ධෘතය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ඕනෑ ම භාෂාවක මේ කතා ව්‍යවහාරය සහ ලේඛන ව්‍යවහාරය කාලානුරූපී ව ක්‍රමයෙන් වෙනස් වීම සිදු වේ. කතා ව්‍යවහාරයේ වෙනස්කම් හඳුනා ගැනීම අසීරු වුව ද ලේඛන ව්‍යවහාරයේ වෙනස්කම් හඳුනා ගැනීමට අධ්‍යයනය කිරීමට ලේඛනාරූඪ වූ තොරතුරු ඉතා වැදගත් වේ. සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ ව සිදු කෙරෙන කෙබඳු ශාස්ත්‍රීය විමර්ශනයක දී වුව ද විශ්වසනීය භාෂාමය සාධක සපයා ගත හැක්කේ

සම්භව සමයෙහි ම නැතහොත් එයට හැකි තාක් සමාසන්න සමයෙහි පටන් වාර්තාගත ව ඇති ලිපි ලේඛන ඇසුරෙනි. ක්‍රිස්තු පූර්ව තුන් වන සියවසේ දී මේ රටේ බුදු සසුන සංස්ථාපිත වූ තැන් පටන් පුරාවට විරස්ථායි වන අයුරින් ලියැවුණ පුරා ලිපි රැසක් ද අනුරාධපුර යුගයේ ද්විතීය භාගයට අයත් සීගිරි කුරුටු ගී ඇතුළු සාහිත්‍යමය ලේඛන හා ග්‍රන්ථ කිහිපයක් ද අප සතු ව තිබේ.

i. ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටුවන ලද්දේ කුමන කාලයක ද?
ii. මෙහි සඳහන් පරිදි සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ විශ්වසනීය භාෂාමය සාධක සපයා ගත හැකි කාලය (සමය) කුමක් ද?
iii. මෙරට පළමු සාහිත්‍ය යුගය හා ඒ කාලයේ නිර්මාණය වූ බව කියවෙන සාහිත්‍ය අංගයක් නම් කරන්න.
iv. භාෂාවක පවත්නා ව්‍යවහාර දෙකක් නම් කරන්න.
v. ලේඛනාරූඪ තොරතුරු වැදගත් වන්නේ කවර හෙයින් ද? (ලකුණු 2×5=10 යි.)

5) මාතර, සමගිගම, අංක 320 ලිපිනයේ පිහිටා ඇති 'වනිතා' කාන්තා සංවිධානය වසර 10ක කාලයක පටන් නව නිෂ්පාදන වෙළෙඳ පොළට හඳුන්වා දෙනු ලබයි. දන්තාලේප, ගෘහ උපකරණ, කේක් වර්ග, රස කැවිලි වර්ග ඒ අතර වේ. ඒ සඳහා වෙළෙඳ පොළේ විශාල ඉල්ලුමක් ඇති ජනප්‍රිය, ප්‍රසිද්ධ නිෂ්පාදන බවට පත් ව ඇත. ඔවුන්ගේ නවතම නිෂ්පාදනය රෙදි සෝදන සබන් සහ සබන් කුඩු වෙළෙඳපොළට හඳුන්වා දීමට නියමිත ය. සාධාරණ මිල, සෞඛ්‍යාරක්ෂිත බව, ලබා ගත හැකි ස්ථාන, නිෂ්පාදනයේ සුවිශේෂතා ආදී කරුණු පිළිබඳ ව ඇතුළත් කරමින් සුදුසු වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න.

නැතහොත්

පාසල තුළ 'පරිසර සංරක්ෂණ සතියක්' පැවැත්වීමට '10 ශ්‍රේණියේ සිසු සමාජය' තීරණය කර ඇත. ඒ සඳහා විදුහල්පතිතුමාගේ අනුමැතිය අවශ්‍ය වේ. මෙම සතියේ ඉටු කිරීමට අපේක්ෂා කරන කටයුතු, ඖෂධ පැළ හා අලංකාරය සඳහා වන පැළ රෝපණය, පරිසර පවිත්‍රතාව, එහි වටිනාකම පිළිබඳ සිසු ප්‍රජාව දැනුම්වත් කරන වීඩියෝ දර්ශන, දේශනයක් ආදී කරුණු මෙහි ඇතුළත් ය. ඔබ, සිසු සමාජයේ ලේකම්වරයා යැයි සිතා මේ සඳහා අනුමැතිය ඉල්ලා සිටිමින් විදුහල්පතිතුමා වෙත ලිපියක් සකස් කරන්න.
(ලකුණු 15 යි.)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	**සිංහල භාෂාව හා සාහිත්‍යය - III**	කාලය / நேரம் / Time: පැය දෙකයි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

සැලකිය යුතුයි:
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත්, 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1) අංක (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට **කෙටි උත්තර** ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නො ලියන්නේ නම්**, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. (අ) නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය, ලංකා මාතා යන කෘති ලියූ කතුවරයා කවුද?

(ආ) කොළඹ කවි යුගය නියෝජනය කළ කවීන් දෙදෙනෙකු නම් කරන්න.

ii. පහත සඳහන් පද්‍යයේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

"රන් විමනේ සිටිමුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑමුත් බඩගිනි නැද්ද

(අ) .....

(අ) .....

iii. "ඇයි ද පියාණන් සමගා
ලෙනෙහි වෙසෙන්නේ
හැර දමා එ රාජ ඉසිරු
උවදුරු අතරේ...."

(අ) මෙසේ පවසන්නේ කවුද?

(ආ) මෙම කොටස ඇතුළත් නාට්‍ය රචකයාගේ වෙනත් නාට්‍යයක් නම් කරන්න.

iv. "..... මෙසේ වූ මහා සේනාවෙන් අපට ගැළවීමක් කෙසේ වේ ද?" යි කීහ.

(අ) මේ කාගේ ප්‍රකාශයක් ද?

(ආ) මෙලෙස විමසා සිටියේ කාගෙන් ද?

Past Papers Wiki

v. රැහි වනපෙතිනැවිදින් සුමුවෝ යා
නිති මියුරුති වෙණ නද ළමුවෝ යා
සිතුවිලි නැති රූ විලස මුවෝ යා
තැති නොගනිති මිනිසුන් සමුවෝ යා

(අ) මෙහි ඇතුළත් උපමාව ලිහිල් බසින් ලියන්න.
(ආ) මෙම පද්‍ය සංග්‍රහයේ කතුවරයාගේ ගුරු හිමියන්ගේ නම කුමක් ද?

vi. "මං අහපු ආරංචියක් නැහැ. කාගෙන් ද ආරංචි අහන්නේ"
(අ) මෙසේ පැවසූ තැනැත්තා සහ ඔහුගේ තනතුර කුමක් ද?
(ආ) ආරංචියක් ඇසීමට යා යුතු යැයි ඔහු යෝජනා කළ ස්ථානය කුමක් ද?

vii. "ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැකගන්නට මෙලොවේ
සමන් වෙතොත් පුත නුඹ වේ "

(අ) මෙම කවියේ ඇතුළත් කාව්‍යාලංකාරයක් නම් කරන්න.
(ආ) මෙම කවිය ඇතුළත් කාව්‍ය පන්තියේ නම කුමක් ද?

viii. පහත සඳහන් කවියේ ඉතිරි පද පේළි සම්පූර්ණ කරන්න.
"රන් තරු පිරිවරා ගත් සඳ මඬල යට

(අ) .....
(ආ) .....
කොඳුරමී කෙඳිරියක් මුළු ලොව නිසල කොට "

ix. "එසේ වී නම් මේ මසු දාස මෝහට දෙව'යි කීය....
(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) 'මෝහට' යනුවෙන් හඳුන්වන තැනැත්තා කවුද?

PAST PAPERS WIKI

x. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා පුද ලද සම්මාන දෙකක් ලියන්න. (ලකුණු 2 x 10 = 20 යි.)

Past Papers Wiki

2) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. සේ රිවිබිම්බා පතළ තෙද බලැති මහරු
මෙන රන් ටැම්බා නිසසල ගුණයෙන් සපිරු
මනරම් යුග බා දී අහස ඔසවන යුරු
නෙ විකුම් සිහ බා පෙරළුවේ ය ගල් පුවරු

(අ) හිරු කිරණ, උසස් යන අර්ථ ප්‍රකාශ වන පරිදි කවියේ යෙදී ඇති පද දෙක ලියන්න.

(ආ) මෙම සිදුවීමෙන් පසු සුප්පා දේවිය ගත් තීරණය කෙටියෙන් ලියන්න.

ii. "…. බෝධිසත්වයන් වහන්සේගේ යෝධයෝ බ්‍රහ්මදත්තයන්ගේ යෝධයනට අතින් මුහුණින් උසුළු පෑ නොයෙක් ප්‍රකාරයෙන් අක්‍රෝෂ පරිභව බෙණෙමින් ගහට කරන්නාහ."

(අ) ඉහත සම්පූර්ණ කොටසේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ආ) මෙම සිදුවීමෙන් පසු කේවට්ටයාගේ පිරිස චූලනී රජු වෙත ගොස් දන්වා සිටියේ කුමක් ද?

iii. "අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙළා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා"

(අ) මෙහි සඳහන් පරිදි අනුවණ ක්‍රියා දෙකක් ලියා දක්වන්න.

(ආ) ජන කවිවල මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

iv. "ලොකු දළුක් පඳුරක් වහල මත වැඩී උළු එහා මෙහා කරමින් මුල් ඇදුණේ ය. බිත්ති අතර කැලය වැඩී ගෙය ඔබා ගත්තෙන් බිත්ති බිඳ වැටී වහල බිමට පාත් විය. කුඩා රතු උළු ගොඩ තණ හා වල් පඳුරුවලින් වසා ගත්තේ ය. බිත්තිවල වරිච්චි කෝටු විශාල පඳුරු බවට වැඩුණේ ය."

(අ) ඉහත ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස කෙටියෙන් ලියා දක්වන්න.

(ආ) ඒ. පී. ගුණරත්න මහතා විසින් පරිවර්තනය කරන ලද වෙනත් නවකතා දෙකක් නම් කරන්න.

v. "කෙසේ හෝ යා නොහැක
ඇතේ තර කර වසා
දොර ලෙනේ මහ ගලින්
පියතුමගෙ රුදු තුමුල
බාහු යුවළින් ම මිස
බැරිය සොලවන්ට එය… "

(අ) මෙම ප්‍රකාශය තුළ සිංහ සීවලී අදහස් කළේ කුමක් ද?

(ආ) සිංහබාහු එය තේරුම් ගත්තේ කෙසේ ද? (ලකුණු 4×5=20 යි.)

PAST PAPERS WIKI

3) • අවස්ථානුකූල ලෙස උපමාවක් හෝ උපමාවලියක් යොදා ගැනීමත්,

• සංවාදශීලී භාෂා භාවිතයත්

උම්මග්ග ජාතකයේ රසවත් බව වැඩි කිරීමට හේතු වී ඇත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් යොදා ගනිමින් ඒ පිළිබඳ විමසන්න.

නැතහොත්

• රැස් ව සිටි සතුන්ගේ සතුට වර්ධනය කිරීමත්,

• සුරහනන්ගේ ආශාව දියුණු කිරීමත් සඳහා ගුත්තිලයන්ගේ වීණා නාදය හේතු වූ ආකාරය එක් කොටසකට උදාහරණ දෙක බැගින් යොදා ගනිමින් විමසන්න. (ලකුණු 15 යි.)

4) • ගැමි ජනතාවට යහපත් ජීවිතයක් සකසා ගැනීමට මඟ පෙන්වීමත්,

• විවාහ ජීවිතයක් සඳහා උපදෙස් ලබාදීමත්,

උපදේශාත්මක ජන කවියෙන් සිදු වේ. 'හානා හීය පානා අඬ හැරෙන් දැනේ' කවි පෙළෙන් උදාහරණ කවි දෙක බැගින් යොදා ගනිමින් ඉහත ප්‍රකාශ තහවුරු කරන්න.

නැතහොත්

• දරුවන්ගේ සුබ සිද්ධිය අපේක්ෂා කරන මවකගේ චරිතය,

• තම අරමුණ කෙසේ හෝ ඉටු කර ගැනීමට උත්සාහ කරන තරුණයෙකුගේ චරිතයත්

සිංහබාහු නාට්‍යයේ නිරූපණය වේ. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් ඉහත ප්‍රකාශ සනාථ කරන්න. (ලකුණු 15 යි.)

5) සංකේත භාවිතය, සරල බස්වහර, සංකල්ප රූප ආදී ලක්ෂණ මැනවින් යොදාගත් කෘතියක් ලෙස 'බැද්දෙගම' නවකතාව හඳුනාගත හැකි ය. සුදුසු උදාහරණ අවස්ථා **තුනක්** ඇසුරින් මේ බව විමසන්න. (ලකුණු 10 යි.)

6) ආත්මාර්ථයෙන් තොර පරාර්ථකාමී දරුවෙකු ගොඩනැගීම අරමුණු කරගත් පැදි පෙළක් ලෙස 'මුනි සිරිපා සිඹිමින්නේ' දැක්විය හැකි ය. යෝග්‍ය කවි **තුනක්** පමණක් යොදා ගනිමින් මේ බව විමසන්න. (ලකුණු 10 යි.)

7) කාව්‍යාලංකාර මනාව යොදා ගනිමින් ගංගාව හා මිනිස් දිවිය පිළිබඳ කරන මනා විවරණයක් ලෙස 'ගංගාවේ සංගීතය' පැදි පෙළ දැක්විය හැකි ය. වඩාත් යෝග්‍ය කවි **තුනක්** යොදා ගනිමින් මේ බව විමසන්න. (ලකුණු 10 යි.)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library